සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

3417

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**


**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2016**
**Year End Evaluation**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade } 11 | විෂයය / பாடம் / Subject } තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I, II | පත්‍රය / வினாத்தாள் / Paper } II |

සැලකිය යුතුයි :
- පළමුවැනි ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු **10** බැගින් හිමි වේ.

**1.**

(i) උද්‍යානයක් අලංකාර කිරීමට පිහිටුවා ඇති වතුර මලක් ක්‍රියාත්මක වීමේ දී වර්ණවත් සූර්යතාප පහනක් ස්වයංක්‍රියව දැල්වෙන ලෙස සකස් කරන ලද පරිපථයක රූප සටහනක් පහත දක්වා ඇත.




ඉහත පරිපථය කාල ගණකයක්, යාන්ත්‍රික ස්විචයක් හා ආලෝක සංවේදකයක් යන ආදානයන්ගෙන් සමන්විතය.

කාලගණකයේ කාලය ප. ව. 6.00 සිට පෙ. ව. 6.00 දක්වා අතර නම් ආදානය 1 වන අතර පෙ. ව. 6.00 සිට ප.ව 6.00 දක්වා කාලය තුළදී ආදානය 0 වේ. යාන්ත්‍රික ස්විචය සංවෘත වී ඇති විට ආදානය 1 වන අතර විවෘත අවස්ථාවේ දී ආදානය 0 වේ. සූර්යතාප පහන හා සම්බන්ධ ආලෝක සංවේදකය ආලෝකය ඇති විට 1 ලෙසත් පරිසරය අඳුරු අවස්ථාවේදී 0 ලෙසත් ආදානයන් ලබා දෙයි.

යාන්ත්‍රික ස්විචය සංවෘතව ඇති විට හා කාල ගණකයේ වේලාව ප. ව. 6.00 සිට පෙ. ව. 6.00 දක්වා සටහන්ව ඇති විට පමණක් වතුරමල ස්වයංක්‍රියව ක්‍රියාත්මක වීම සිදු වන අතර එම අවස්ථාවේ දී ඊ හා සම්බන්ධව ඇති සූර්යතාප පහන දැල්වීම ද සිදු වේ. මෙම සූර්යතාප පහන දැල්වීම සඳහා පරිසරය අඳුරු වීම හා වතුරමල ක්‍රියාත්මක වීම යන අවස්ථා දෙකම සම්පූර්ණ වී තිබිය යුතු බව ද සලකන්න.

සූර්යතාප පහන ක්‍රියාත්මක වන අවස්ථාව නිරූපනය කිරීමට සුදුසු පරිපථ සටහන මූලික ද්වාර භාවිතයෙන් ඇඳ දක්වන්න.

(ii) $F = (A + B).\ (A.\bar{B})$ යන බූලීය ප්‍රකාශනයට අදාළ පරිපථ සටහන නිරූපිත සත්‍යතා වගුව ඇඳ දක්වන්න.

(iii) සිසුවෙක් පරිසර දින සැමරුම වෙනුවෙන් ඉ සමර්පණයක් නිර්මාණය කිරීමට අදහස් කරයි. මේ සඳහා පැතලි තල සුපරික්සකය (Flat bed Scanner) භාවිතයෙන් සඟරාවක ඇති පින්තූර ලබා ගැනීමටත් අවශ්‍ය විස්තර යතුරු පුවරුව (Key Board) මගින් ආදානය කිරීමටත් කටයුතු කරයි. සකසන ලද ඉදිරිපත් කිරීමේ මෘදු පිටපත බහු මාධ්‍ය ප්‍රක්ෂේපකය (Multimedia Projector) භාවිතයෙන් නැරඹීමට සැලැස්වීමටත්, පසුව USB උපක්‍රමයට පිටපත් (Copy) කර ලේසර් තාක්ෂණය සහිත මුද්‍රණ යන්ත්‍රයක් (Laser Printer) භාවිතයෙන් දෘඪ පිටපත් ලබා ගෙන ප්‍රේක්ෂකයන්ට ලබා දීමටත් අදහස් කරයි. ඉහත ක්‍රියාකරකම් හා සම්බන්ධ වූ ආදාන උපක්‍රම දෙකක් සහ ප්‍රතිදාන උපක්‍රම දෙකක් හඳුනාගෙන ලියා දක්වන්න.

(iv) පහත අවස්ථා සලකන්න.

A. තට්ටු 15 කින් සමන්විත ගොඩනැගිල්ලක ඉහළට හා පහළට යාම සඳහා විදුලි සෝපානයක් භාවිත කරයි.සෑම මිනිත්තු දෙකකට වරක් සෝපානය ඉහළට ගොස් නැවත පහළට එයි.

B. විවේකී දිනයක රූපවාහිනයේ විකාශනය වන සංගීත වැඩසටහනක් නැරඹීම.

C. ජංගම දුරකථන භාවිතයෙන් ආයතනයක ශාඛා ප්‍රධානීන් හා වීඩියෝ සංවාදයක් පැවැත්වීම.


D. තනි දුම්රිය ධාවන පථයක් සහිත පාලමක් මතින් දුම්රිය දෙකක් දෙපසට ධාවන ය වීම.

ඉහත A, B, C හා D සංසිද්ධීන් උදාහරණ වන්නේ කවර දත්ත සම්ප්‍රේෂණ විධි (Data transmission mode) නිරූපණය සඳහා ද?

(v) සංඛ්‍යා පද්ධති අතර පරිවර්තන භාවිතකර පහත වගුව සම්පූර්ණ කරන්න.

| දශමය | ද්විමය | අෂ්ටමය | ෂඩ් දශමය |
|---|---|---|---|
| 174 | ............... | ............ | $AE_{16}$ |
| ............. | $100111011_2$ | $473_8$ | .............. |

(vi) පහත තාර්කික පරිපථයේ C ප්‍රතිදානය සඳහා සුදුසු බූලීය ප්‍රකාශනය ලියා දක්වන්න.




(vii) මෙහෙයුම් පද්ධති (Operating System) ඒවායේ ක්‍රියාකාරිත්වය අනුව පහත ආකාරයන්ට වර්ග කළ හැක. ඒ එක් එක් මෙහෙයුම් පද්ධතිය සඳහා ගැළපෙන පිළිතුර දී ඇති ලැයිස්තුවෙන් තෝරා ලියන්න.

A. ඒක පරිශීලක
B. බහු පරිශීලක
C. බහු කාර්ය
D. තත්‍යකාල

ලැයිස්තුව :

**MS DOS** **Windows Server**

**ගණක යන්ත්‍රයේ මෙහෙයුම පද්ධතිය**

**Ms Word** **Ubuntu**

(viii) පහත වගන්ති සත්‍ය හෝ අසත්‍ය බව ලියා දක්වන්න

A. අන්තර්ජාලය භාවිත කිරීම සඳහා බ්‍රවුසරයක් (Web Browser) තිබීම අනිවාර්ය වේ.

B. විද්‍යුත් ලිපින පරිශීලක නාමයේ ඉඩක් (Space) තැබිය හැකිය.

C. වසම් නාම සේවාදායකය (DNS) තුළ වෙබ් අඩවි ගබඩා කර ඇත.

D. විද්‍යුත් තැපැල් ලිපියක් අදාල පුද්ගලයාට යොමු කිරීමට නොහැකි වූ විට යවන්නා වෙත දෝෂය සටහන් කරමින් පණිවුඩයක් ලබා දීමේ සේවාවක් ඇත.

(ix) පහත දක්වා ඇති A හා B කාණ්ඩ දෙක සලකා බලන්න. A කාණ්ඩයේ වෙබ් අඩවියක් නිර්මාණය කිරීමේ දී හඳුනාගත් අවශ්‍යතාවය ද B කාණ්ඩයේ වෙබ් අඩවියක ලිපිනය ද දැක්වේ. එක් එක් අවශ්‍යතාවට ගැලපෙන වෙබ් අඩවිය B කාණ්ඩයෙන් තෝරා දී ඇති ලේබල භාවිත කරමින් නිවැරදි ගැලපීම ලියා දක්වන්න.

| | A කාණ්ඩය | | B කාණ්ඩය |
|---|---|---|---|
| 1 | වෙළඳාම (e Commerce) | P | www.linkedin.com |
| 2 | සමාජ සම්බන්ධතා (Building up social media) | Q | www.bing.com |
| 3 | ප්‍රවෘත්ති බෙදා හැරීම (News) | R | www.amazon.com |
| 4 | සෙවුම් අවශ්‍යතාව (Search engine) | S | www.bbc.co.uk |

(x) පූර්ණ සංඛ්‍යා ඇතුළත් කළ හැකි අවයව 8 කින් සමන්විත හඳුන්වා දී ඇති අරාවෙහි (Array) හිස්තැන් සඳහා සුදුසු පිළිතුරු දී ඇති ලැයිස්තුවෙන් තෝරා අදාළ අංකය ඉදිරියෙන් සඳහන් කරන්න.

......❶........num : .....❷.....[0..❸] of....❹......;

ලැයිස්තුව - (Boolean, var, 8,list, integer, array, 7)

2. "හරිස්චන්ද්‍ර ගාමන්ට්ස්" ඇඟළුම් ආයතනය සම්බන්ධ පහත පැතුරුම්පත සලකන්න.

| | A | B | C | D | E | F | G | H |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | හරිස්චන්ද්‍ර ගාමන්ට්ස් | | | | | | | |
| 2 | විකිණීමට තීරණය කල මිළ | | | | විකුණූ මිළ | | | |
| 3 | ඇඳුම් වර්ග ය | එක් ඇඳුමක මිළ රු. | | | ජනවාරි | පෙබරවාරි | මාර්තු | |
| 4 | කමිස | 700 | | කමිස | 630 | 560 | 525 | |
| 5 | ගවුම | 600 | | ගවුම | 540 | 480 | 450 | |
| 6 | හැට්ට | 500 | | හැට්ට | 450 | 400 | 375 | |
| 7 | | | | | | | | |
| 8 | | | | | | | | |
| 9 | මාසය | ජනවාරි | පෙබරවාරි | මාර්තු | | | | |
| 10 | මිළ අඩුකිරීමේ ප්‍රතිශතය | 10% | 20% | 25% | | | | |
| 11 | | | | | | | | |
| 12 | | විකුණූ ප්‍රමාණය | | | මිළ | | | |
| 13 | | ජනවාරි | පෙබරවාරි | මාර්තු | ජනවාරි රු. | පෙබරවාරි රු. | මාර්තු රු. | |
| 14 | කමිස | 2000 | 2500 | 2900 | 1260000 | 1400000 | 1522500 | |
| 15 | ගවුම | 3100 | 3700 | 4200 | 1674000 | 1776000 | 1890000 | |
| 16 | හැට්ට | 2700 | 2900 | 3200 | 1215000 | 1160000 | 1200000 | |
| 17 | | ආදායම | | | 4149000 | 4336000 | 4612500 | |
| 18 | | | | | | | | |

දිවයිනේ පිහිටි ප්‍රසිද්ධ ඇඟළුම් ආයතනයක් වන මෙහි, නිෂ්පාදන කළමනාකරු නිම් ඇඳුම් සඳහා තීරණය කළ මිළ B4 කෝෂයේ සිට B6 කෝෂය දක්වා ඇත. නමුත් අධ්‍යක්ෂ මණ්ඩලය එක් එක් ඇඳුම් වර්ග සඳහා ජනවාරි, පෙබරවාරි , මාර්තු මාසයන්හි විශේෂ මිළ අඩුකිරීමක් සිදුකිරීමට අදහස් කර ඇත. එම වට්ටම් ප්‍රතිශත B10, C10, D10 කෝෂවල සටහන් කර ඇත.

i. විශේෂ මිළ අඩුකිරීමෙන් පසු කමිසයක් විකුණූ මිළ E4 කෝෂයට ලබා ගැනීම සඳහා ලිවිය යුතු සූත්‍රය කුමක් ද? එම සූත්‍රය භාවිතයෙන් ඉතිරි ඇඳුම් වර්ග සඳහාද ජනවාරි සිට මාර්තු දක්වා විකුණුම් මිළ සෙවිය යුතු බව සලකන්න.

ii. E4 කෝෂයේ ඇති සූත්‍රය E5 සිට E6 දක්වා පිටපත් කිරීමට අවශ්‍ය පියවර ලියා දක්වන්න.

iii. ජනවාරි මාසයේ ඇඳුම් විකිණීමෙන් ලැබූ මුළු ආදායම ගණනය කිරීම සඳහා E17 කෝෂයට ලිවිය යුතු සූත්‍රය කුමක් ද?

iv. ජනවාරි සිට මාර්තු දක්වා ලැබී ඇති වැඩිම ආදායම සෙවීම සඳහා E18 කෝෂයට ලිවිය යුතු සූත්‍රය කුමක් ද?

v. ජනවාරි සිට මාර්තු දක්වා එක් එක් ඇඳුම් වර්ග සඳහා ලැබී ඇති ආදායම් සැසඳීම සඳහා යෝග්‍ය ප්‍රස්ථාර වර්ගය කුමක් ද?

3. පහත දී ඇති වගු මගින් පොත් බෙදාහැරීමේ නියෝජිත ආයතනයක ගබඩාවක ඇති පොත් කිහිපයක හා පොත් ප්‍රකාශකයන්ගේ දත්ත ඇතුළත් දත්ත සමුදායක් පෙන්වා ඇත.

**Book Table**

| Book_Id | Book_Name | Author_Name | No_Of_Books | Unit_Price |
|---|---|---|---|---|
| B100 | මගේ ජීවිත කතාව | මහාචාර්ය ජේ. බී. දිසානායක | 2000 | රු. 180 |
| B101 | කාල නදී ගලා බසියි | නෝබට් අයගමගේ | 4000 | රු. 550 |
| B102 | සෙංකොට්ටං | මහින්ද ප්‍රසාද් මස්ඉඹුල | 3500 | රු. 300 |
| B103 | හිමගිර භික්ෂුව | සුනේත්‍රා රාජකරුණා | 5000 | රු. 290 |

**Publisher Table**

| Pub_Id | Pub_Name | ISBN |
|---|---|---|
| P001 | දයාවංශ ජයකොඩි | 955-551-126-8 |
| P002 | ෆාස්ට් ප්‍රින්ටින් | 978-955-677-248-7 |
| P003 | සන්ථව ප්‍රකාශන | 978-955-0980-00-0 |
| P004 | තරංජි ප්‍රින්ටර් | 978-955-0600-15-1 |

**Book_Publisher Table**

| Pub_Id | Book_Id | Year |
|---|---|---|
| P001 | B100 | 2004 |
| P002 | B101 | 2014 |
| P003 | B102 | 2013 |
| P004 | B103 | 2013 |

i. මෙම දත්ත සමුදාය පද්ධති තුළ භාවිත කළ හැකි ප්‍රාථමික යතුරු (Primary Key) ක්ෂේත්‍ර 2 ක් වගු වල නම් ද සහිතව ලියා දක්වන්න.

ii. මෙම ගබඩාව සඳහා 2015 වර්ෂයේ දී ප්‍රකාශිත රු.230 ක වටිනාකම ඇති අනුරාධා ආරියරත්න විසින් රචිත "ලාවෙන් තතු බිඳක්" පොත් 3500 ක් අලුතෙන් එක් කරන ලදී. දයාවංශ ජයකොඩි සමාගමෙන් ප්‍රකාශයට පත් කළ මෙම පොත සඳහා ලබා ගත් ISBN අංකය 955-555-128-2 වේ.

(a) මෙහි දී යාවත්කාලීන කළ යුතු වගු (ව) මොනවා ද?

(b) යාවත්කාලීන වූ වගුවට / වගුවලට අදාළ නව රෙකෝඩ (ය) ලියා පෙන්වන්න.

iii.

(a) ඉහත වගු තුන වෙනුවට තනි වගුවක් භාවිත කළේ නම් ඇති වන දෝෂය කුමන නමකින් හැඳින්වෙයි ද?

(b) ඉහත (a) හි සඳහන් කරන ලද තත්ත්වය නිසා ඇති විය හැකි අවාසි 2 ක් දක්වන්න.

iv. 2013 හා 2014 වර්ෂ සඳහා සාහිත්‍ය සම්මාන ප්‍රධානය කිරීමේ වැඩසටහනකට මහින්ද ප්‍රසාද් මස්ඉඹුල විසින් 2013 දී රචිත සෙංකොට්ටං නවකතාව හා 2014 වර්ෂයේ දී නෝබට් අයගමගේ විසින් රචිත කාල නදී ගලා බසී යන පොත් දෙක නිර්දේශ වී ඇතැයි ප්‍රකාශයට පත් කරන ලදී.

*පොතේ නම, කතෘ නම, ප්‍රකාශිත වර්ෂය හා මිල* යන ක්ෂේත්‍ර වලින් සමන්විත වගුවකින් ඉහත තොරතුරු සොයා ගන්නා ලද්දදේ නම් අදාළ රෙකෝඩ් අනන්‍යව හඳුනා ගත හැකි යතුර කුමක්දැ යි දක්වා අදාළ ක්ෂේත්‍ර නාමය / නාමයන් ද සඳහන් කරන්න.

**4.** මිනිසාගේ එදිනෙදා ජීවිතය පහසු කිරීමට අත්‍යවශ්‍ය බොහෝ අංග නිපදවමින් මිනිසාගේ සමීපතම මිතුරා වන්නට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට හැකි වුව ද එය භාවිතයේ දී ඇතිවන ගැටලු බොහොමයකට මුහුණ දීමට මේ වන විට මිනිසාට සිදුවී ඇත.

i. පරිගණක භාවිතයේ දී ඒවා ආරක්ෂාකාරීව භාවිත නොකිරීම මගින් භෞතික හා තාර්කික ගැටලු මතුවේ. මෙවැනි අවස්ථා වලදී භෞතික ආරක්ෂාව (Physical Security) හා තාර්කික ආරක්ෂාව (Logical Security) සඳහා උපක්‍රමය බැගින් දෙන්න.

ii. සදාචාරාත්මක ගැටළුවක් නොවන පරිදි අන්තර්ජාල සම්පත් තම ප්‍රයෝජනය සඳහා යොදා ගත හැකි ආකාර දෙකක් සඳහන් කරන්න.

iii. නොයෙකුත් හානිකර මූලද්‍රව්‍යයන්ගෙන් සමන්විත ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය අනිසි ලෙස බැහැර කිරීම නිසා මිනිසාට මෙන් ම පරිසරයට ද සිදු වී ඇති හානිය අති මහත් ය. පරිසරය අපවිත්‍ර වීමේ දී එහි අහිතකර බලපෑමට ගොදුරු වන්නේ මිනිසා ම ය.

a. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ලෙස ඔබ අදහස් කරන්නේ මොනවාද?

b. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වලින් පරිසරයට බැහැර වන මිනිස් සිරුරට හානිකර මූලද්‍රව්‍ය 2 ක් සඳහන් කරන්න.

c. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කිරීම කළහැකි ආකාර දෙකක් දක්වන්න.

iv.

a. අංකිත සේතුව (Digital Bridge) යනු කුමක්ද?

b. අංකිත සේතුව ඇති කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

**5.** *"පැෂන් මාට්"* රෙදිපිළි වෙළඳ සැල තම ව්‍යාපාරික කටයුතු කාර්යක්ෂම හා පහසු කරගැනීමේ අරමුණින් තොරතුරු පද්ධතියක් සංවර්ධනය කර ගැනීමට අදහස් කරයි. ඔවුන් තම කාර්යය පද්ධති සංවර්ධන ආයතනයකට පවරයි.

i. පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ (SDLC) පියවර සඳහන් කරන්න.

ii. පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ පළමු පියවරේ දී පරිශීලක අවශ්‍යතා එක් රැස් කිරීමට ඉහත පද්ධති සංවර්ධන ආයතනය නියමු (prototyping) තාක්ෂණය යොදා ගන්නා ලදී. එහිදී ඔවුන් කරනු ලද ඇතැයි සිතිය හැකි කාර්යය කෙටියෙන් දක්වන්න.

iii. ඉහත කාර්යය සඳහා පුනර්කරණ වෘද්ධි ආකෘතිය යොදා ගැනීමට පද්ධති සංවර්ධන ආයතනය තීරණය කරන ලදී. පහත දැක්වෙන්නේ දිය ඇලි ආකෘතියේ (waterfall model) හා පුනර්කරණ වෘද්ධි ආකෘතියේ (Iterative Incremental Model) ලක්ෂණ කිහිපයකි. එහෙත් වෙන් කර නැත. ලේබල යොදා ගෙන ඒවා ඉහත ආකෘති දෙකට වෙන් කරන්න.

*A.* පළමු ව අවශ්‍යතා හොඳින් හඳුනාගත යුතු ය.

*B.* පද්ධති සංවර්ධකයන් (*System developers*)හට තමන් පෙර පියවරවල දී ලබාගත් දැනුම භාවිතයට ගත හැකි වීම වාසියකි.

*C.* එක් පියවරක් සම්පූර්ණයෙන් ම අවසන් කිරීමෙන් පසු අනෙක් පියවර ආරම්භ වේ.

*D.* පද්ධතිය සම්පූර්ණයෙන් ම සංවර්ධනය වන තුරු පුනර්කරණය වෙමින් වැඩි දියුණු කෙරේ.

*E.* සෑම පුනර්කරණයක දී ම පද්ධති සැලසුමෙහි වෙනස්කම් සිදුකෙරෙන අතර නව ක්‍රියාකාරිත්වයන් එකතු වේ.

*F.* මෙම සංවර්ධන ආකෘතියෙහි ප්‍රධාන අදහස වන්නේ එක් වතාවකට කුඩා කොටසක් බැගින් නැවත නැවත පුනර්කරණය වන්නා වූ (***iterative***)සහ සෑම පුනර්කරණයක දී ම වැඩි දියුණු වන්නා වූ (***incremental)*** ආකාරයට පද්ධතියක් සංවර්ධනය කිරීමයි.

*G.* සංවර්ධිත පද්ධතියේ අවසාන ප්‍රතිඵලය දැක ගැනීමට හැකි වන්නේ අවසාන අදියරේ දී ය. එබැවින් පද්ධතිය මගින් බලාපොරොත්තු නොවූ ප්‍රතිඵලයක් ද ලැබිය හැකි ය.

*H.* මෙහි ප්‍රධාන පියවර ආරම්භ වන්නේ පද්ධතියේ අවශ්‍යතාවක් සරල ව ක්‍රියාත්මක කිරීම මගිනි.

iv. පද්ධති නඩත්තු (system maintenance) අදියරේ දී පද්ධති සංවර්ධන කණ්ඩායමට මැදිහත් වීමට සිදුවන අවස්ථා දෙකක් සඳහන් කරන්න.

**6.**

(a) i සිට iv දක්වා ඇති හිස්තැන් පිරවීම සඳහා වඩාත් සුදුසු වදන දී ඇති වචන අතරින් තෝරා ලියන්න.

ප්‍රශ්ණ අංකය හා ඊට අනුරූප වදන පමණක් ලිවීම සෑහේ.

[ස්ථිතික , ගතික, විවෘත කේත, හිමිකම් ආශ්‍රිත , www.nie.lk , www.nic.lk , Hyperlink Hypertext]

i. ________________ වෙබ් අඩවි සන්ධාරය නිරන්තරයෙන් වෙනස්වේ, මෙම වෙබ් අඩවි PHP, ASP.net වැනි පරිගණක භාෂාවලින් සකස් කර ඇත.

ii. Kompozer යනු ________________ වෙබ් සංස්කාරක මෘදුකාංගයකි. (Web Authoring Tool)

iii. .lk ඉහළ මට්ටමේ වසම් නාමය ලබා ගැනීම සඳහා ______ වෙබ් අඩවියෙන් ඉල්ලුම් කළ යුතුය.

iv. HTML භාෂාව භාවිතයෙන් නිර්මාණය කරන ලද වෙබ් අඩවි ______________ වෙබ් අඩවි වේ.

(b) වගුවේ දී ඇති HTML (Source Code) මූල කේත හා එහි අනුරූප ප්‍රතිදානය (Output) සලකා බලන්න.මෙම කේතය සඳහා 1 සිට 10 තෙක් නම් කරන ලද HTML උසුලන (tags) හා උපලක්ෂණ (attribute) දහයක් පවතී. හිස්තැන් සඳහා ලිවිය යුතු HTML උසුලන හා උප ලක්ෂණ ලියා දක්වන්න.


මූල කේතය (Source Code)

```
<html>
<head>
<title>Sandatanne</title>
</head>
<body>
<❶>Worlds End at Moon Plains-Nuwara Eliya<❷>නුවර එළියේ සඳතැන්න ලෝකාන්තය</h1>
<❸="red">
<❹><img src="moon plains.jpg"width="300" height="150"></❹>
<❺>Moon Plains(also known as Sandatanne,Sandagalatanne)is the latest attraction open to public in Nuwara
Eliya.It is located few kilometers off Nuwara Eliya. This area is now classified as an Agricultural and
Environmental Tourism Zone by the Municiple of Nuwara Eliya and was declared opened in 25th March 2014.</p>
<h2>Animals who can be spotted in the plains are</h2>
<❻>
<li>Elk</li>
<li>wild buffaloes</li>
<li>dear</li>
<li>leopards</li>
<li>many types of birds</li>
</❼>
<table border="1">
<tr><❽>Route From Nuwala Eliya  Moon Plains</th></tr>
<tr><td>Through</td><td>Mahagastota</td>
<tr><td>Distance</td><td>7 km</td>
<tr><td>Travel time</td><td>30 mins</td>
<tr><td>Driving Directions</td> <td><❾="sandatanne">see on google maps</a></td>
</tr>
</table>
<❻ >
<li>Opening hours <❿>from 7 AM to 5 PM all seven days</❿> </li>
</❼>
</body>
</html>
```

(Output) ප්‍රතිදානය

# Worlds End at Moon Plains-Nuwara Eliya
# නුවර එළියේ සඳතැන්න ලෝකාන්තය

---



Moon Plains(also known as Sandatanne.Sandagalatanne)is the latest attraction open to public in Nuwara Eliya.It is located few kilometers off Nuwara Eliya. This area is now classified as an Agricultural and Environmental Tourism Zone by the Municiple of Nuwara Eliya and was declared opened in 25th March 2014.

## Animals who can be spotted in the plains are

- Elk
- wild buffaloes
- dear
- leopards
- many types of birds

| Route From Nuwala Eliya Moon Plains | |
|---|---|
| Through | Mahagastota |
| Distance | 7 km |
| Travel time | 30 mins |
| Driving Directions | see on google maps |

- Opening hours from 7 AM to 5 PM all seven days

(c) ඉහත දී ඇති මූලකේතයේ "නුවර එළියේ සඳතැන්න ලෝකාන්තය" යන්න සිංහලෙන් යොදා ඇත. මෙවැනි අවස්ථාවක මූලකේතය ගබඩා කළ යුතු ආකාරය කෙටියෙන් දක්වන්න.

7.

(a) එක්තරා විශ්ව විද්‍යාලයක සිසුන් 2000 ක් සිටිති. එක් එක් සිසුවාගේ දෙමාපියන්ගේ වාර්ෂික ආදායම රු. 250000 ට අඩු නම් එම සිසුන්ට "මහපොළ ශිෂ්‍යත්වය" හිමිවේ. ආදායම රු.250000 සිට රු.500000 දක්වා නම් එම සිසුන්ට "ශිෂ්‍යාධාර" හිමිවේ. ආදායම රු. 500000 ට වැඩි නම් එම සිසුන්ට කිසිදු ආධාර මුදලක් හිමි නොවේ. පහත ව්‍යාජ කේතය මගින් එක් එක් සිසුවාගේ ඇතුලත්වීමේ අංකය හා ලැබෙන දීමනාවේ ආකාරය මුද්‍රණය වේ.

```
N=1
while N<=2000
        getAdmssionNumber
        get Income
        if  Income <250000 then
                allowance = "Mahapola"
        else
                if Income<=  500000 then
                        allowance = "Bursary"
                else
                        allowance = "No allowance"
                endif
        endif
        displayAdmssionNumber , allowance
        N=N+1
end while
```

ඉහත ව්‍යාජ කේතය නිරූපණය කිරීම සඳහා ගැලීම් සටහනක් අඳින්න.

(ඔබගේ ගැලීම් සටහනෙහි විචල්‍ය නාම, ව්‍යාජ කේතයෙහි දී ඇති ආකාරයටම යොදා ගන්න. )

(b) පහත දැක්වෙන්නේ 10 සිට 1 දක්වා සංඛ්‍යා මුද්‍රණයකිරීම සඳහා ලියන ලද අසම්පූර්ණ Pascal කේතයකි. එහි හිස්තැන් සඳහා ❶ සිට ❹ තෙක් ලේබල් යොදා ඇත. ලේබල් වලට අදාල නිවැරදි ප්‍රකාශන ලියා දක්වන්න.

```
        Program PrintNumbers;
var x: ❶ ;
begin
❷x := 10 ❸ 1  do
❹(x);
readln();
end.
```